# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1688/4 - 2011 ජනවාරි 10 වැනි සඳුදා - 2011.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

විධාන අංක : 33.

### 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

### 10(1)(ආ) (ii) වැනි වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10(1)(ආ)(ii) වැනි වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කටයුතු කරමින්, දේශීයව නිෂ්පාදිත සියලු එළවළු සහ පළතුරු තෙලීමේ දී, රැස්කිරීමේ දී, ගබඩා කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමේ දී හෝ ප්‍රදර්ශනය කිරීමේ දී, ප්ලාස්ටික් හෝ ඝන කඩදාසි හෝ දැව වලින් සකසා ඇති ඇසුරුම් භාවිතා කළ යුතු බවත් එක් ඇසුරුමක ඇසිරිය හැකි උපරිම එළවළු හෝ පළතුරු වල ශුද්ධ බර කිලෝග්‍රෑම් 25 නොඉක්මවිය යුතු බවත් සියලු දේශීය එළවළු සහ පළතුරු නිෂ්පාදකයින්, ප්‍රවාහනය කරන්නන්, බෙදාහරින්නන් හා වෙළෙන්දන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2011 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ දී ය.

01-523